චක්‍රලේඛ අංක:- 01/2006

මගේ අංකය:- බප/සසේකො/ලේ.නිර්/2006
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක. 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2006.01.31

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති සභාපතිවරුන්
වෙත.

## සමුපකාර සේවකයින් සඳහා 2006 වර්ෂයේ නිවාඩු

සමුපකාර සේවා කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමුපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී කාර්යාල සේවක පණත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමුපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| | | |
|---|---|---|
| 01. | ජනවාරි 14 | දෙමළ තෛපොන්ගල් දිනය |
| 02. | පෙබරවාරි 04 | ජාතික දිනය |
| 03. | අප්‍රේල් 11 | නබි නායකතුමාගේ ජන්ම දිනය |
| 04. | අප්‍රේල් 13 | සිංහල /දෙමළ අළුත් අවුරුදු දිනට පෙර දිනය |
| 05. | අප්‍රේල් 14 | සිංහල /දෙමළ අළුත් අවුරුදු දිනය |
| 06. | මැයි 01 | මැයි දිනය |
| 07. | මැයි 12 | වෙසක් පුර පසළොස්වක දිනයට පසු දින |
| 08. | දෙසැම්බර් 25 | නත්තල් දිනය |

02. ඉහත සඳහන් දිනයන්ට අමතරව සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සමුපකාරිකයන්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන දිනයද නිවාඩු වශයෙන් දිය යුතුය. තවද මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි "රජයේ නිවාඩු" දිනයන් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන දිනයන් සඳහා හාම්පුතුන්ගෙන්ද සිය සේවකයන් සඳහා නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කලහොත් එවැනි අවස්ථාවල සමුපකාර සමිතිවලටද අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයන්ට නිවාඩු දීම ගැන තීරණය කළ හැකිය. 2006 වර්ෂය සඳහා සිංහල/දෙමළ අවුරුද්දට පෙර දිනයත, නිවාඩු වශයෙන් යොදා ඇති බැවින් පාරිභෝගිකයන්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාලය හෝ ප්‍රාදේශිකයන් මේ දිනවල එක් දිනක් හෝ දින දෙකම හෝ විවෘතව තැබීමටත, එම දිනවල වැඩ කිරීම සඳහා සේවකයන්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියා කරනු ලැබූ අවස්ථාවලදී ඒ වෙනුවෙන් සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලතදී සේවකයන්ට නිවාඩු ලබා දිය යුතුය. මෙසේ සමිති කාර්යාලයන්, සමිති ප්‍රාදේශිකයන් විවෘතව තබන අවස්ථාවලදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත් නොපමාව ඒ බැව් කොමිෂන් සභා වෙත වාර්තා කළ යුතුය.

03. ඉහත දැක්වූ නිවාඩු දින වලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු දින 1 1/2 ට ඇතුලත් වුවහොත් ඒ වෙනුවට පිළිවෙලින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුලතදී සේවකයන්ට නිවාඩු වශයෙන් දිය යුතුය. මීට විකල්පයක් වශයෙන්

....2 පිටුවට/

චක්‍රලේඛ අංක:-01/2006(1)

මගේ අංකය:-බප/සසේකො/ලේ.නිර්/2006

සමූපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.)
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2006.05.09

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති සභාපතිවරුන්
වෙත.

සමුපකාර සේවකයින් සඳහා 2006 වර්ෂයේ නිවාඩු

මගේ සමාංක හා 2006.01.31 දිනැති 01/2006 චක්‍රලේඛය මගින් මැයි මස 12 වන දින වෙසක් පුරපසොලොස්වක දිනයට පසු දින වශයෙන් සඳහන් වීම ප්‍රමාද දෝෂයක් බවත් එය 13 වශයෙන් සංශෝධනය විය යුතු බවත් මෙයින් දැනුම් දෙමි. මේ අනුව අවශ්‍ය සංශෝධනයන් සිදු කර ගන්නා ලෙස දැනුම් දෙමි.

ජේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමුපකාර හා පළාත් මාර්ග අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම්(බ.ප.)
3. ලේකම්, සමුපකාර හා පළාත් මාර්ග අමාත්‍යංශය(බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්(බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්